www.agaram.lk

0483

OL/2017/15-S-I, II (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

15 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ක්‍රිස්තියානි ධර්මය I, II
கிறிஸ்தவம் I, II
Christianity I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## ක්‍රිස්තියානි ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ජුදෙව් ජනමතය අනුව ගාබ්‍රියෙල් දේවදූතයා ගෙන එන්නේ,
(1) අසුභවාදී හසුනකි. (2) බිය ගෙන දෙන හසුනකි.
(3) පුදුමය දනවන හසුනකි. (4) ශුභ හසුනකි.

**2.** "ඔහු මිදි යුෂවත් මත්පැන්වත් නොබොන්නේ ය." මෙයින් අදහස් කරන්නේ ස්නාවක ජොහන්
(1) බීමත්කම යන සංකල්පය සීමිතව පිළිගැනීමයි. (2) නසරිය විනය අනුව ඇති දැඩි කළ යුතු බවයි.
(3) නාසරත් නගරයට අයත් පුද්ගලයකු බවයි. (4) ශුද්ධවන්තව තාපසාරාමයේ ජීවත් වන බවයි.

**3.** කිතුනු දරුවන් දොළොස් හැවිරිදි ජේසු දරුවාගෙන් ඉගෙන ගත යුත්තේ කිතුනු ජීවිතය යනු
(1) වගකීමෙන් යුතුව ක්‍රියා කිරීමයි. (2) අන් අය සතුටු කිරීමයි.
(3) දේව වචනය හැදෑරීමයි. (4) දෙමව්පියනට ඇහුම්කන්දීමයි.

**4.** ජේසුස් වහන්සේගේ මෙහෙවර සඳහන් වන්නේ ස්නාවක ජොහන්ගේ පහත සඳහන් කුමන ප්‍රකාශයෙන් ද?
(1) මට පසුව එන තැනැත්තා මට වඩා උතුම් ය.
(2) මෙම ගල්වලින් ආබ්‍රහම්ගේ දරුවන් උපදවන්නට දෙවියන් වහන්සේට හැකි ය.
(3) ශුද්ධාත්මයාණන්ගෙන් ද ගින්නෙන් ද ඔබ බෞතිස්ම කරන සේක.
(4) උන් වහන්සේගේ පාවහන් පටි මුදවන්නටවත් මම නොවටිමි.

**5.** 'දෙවියන් වහන්සේට භය ඇත්තන්' ලෙස හැඳින්වෙනුයේ අන්‍ය ජාතීන්,
(1) දේව මාලිගයට ඇතුළු වී බෞතිස්ම ලැබූ පසුව ය.
(2) චර්ම ඡේදනය කර බෞතිස්ම ලැබූ පසුව ය.
(3) ජුදා ආගම ඉගෙනගෙන බෞතිස්ම ලැබූ පසුව ය.
(4) සිනගෝගයේ දී බෞතිස්ම ලැබූ පසුව ය.

**6.** ධර්මදූත සේවයේ භාරදූරත්වය වටහා දීමට ජේසුස් වහන්සේ කළ ප්‍රකාශය කුමක් ද?
(1) ගොයම නම් බහුල ය. ගොවීහු විරල ය. (2) පාද යට දූලි ගසා දමන්න.
(3) වගවලසුන්ගේ මැදට බැටළු පැටවුන් යවමි. (4) මග දී ආචාර කිරීම සඳහා පමා නොවන්න.

**7.** ක්‍රිස්තුස් හා එම්මානුවෙල් යනු හෙබ්‍රෙව් සහ ග්‍රීක බසින් අනුපිළිවෙළින්,
(1) ආලේප ලත් තැනැත්තා හා දෙවියන් වහන්සේ අප සමග ය.
(2) පූජක හා රජු ය.
(3) ටෝරා හා මෙසියස් ය.
(4) ඊජිප්තුව හා බැබිලෝනියාව ය.

**8.** "ඉසිලිය නොහැකි බර ඔබ මිනිසුන් පිට පටවන්නාහ" මෙසේ ජේසුස් වහන්සේ චෝදනා එල්ල කළේ,
(1) හෙරෝද් රජුට ය. (2) පරිසිවරුන්ගේ විනයධරයන්ට ය.
(3) රෝම අධිරාජ්‍යයාට ය. (4) සද්දුසිවරුනට ය.

[ දෙවැනි පිටුව බලන්න

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**9.** පහත දැක්වෙන්නේ පාවුල්තුමා පිළිබඳ තොරතුරු කිහිපයකි.

තාර්සස් හි උපත ලැබීම → රෝම පුරවැසිභාවය → ජුදෙව් පවුලක උපත

පරිසියෙක් ලෙසට ඉගෙනගෙන වැඩීම → කූඩාරම් කර්මාන්තය ගැන දැනුම → මව් කුස පටන් කැඳවීමට සුදානම

ඉහත තොරතුරුවලින් දැක්වෙන්නේ,
(1) දෙවියන් වහන්සේ පාවුල්ගේ පසුබිම සැකසූ අන්දම ය.
(2) ඔහු මුහුණ දුන් අභියෝග හා දුක් කරදර ය.
(3) පාවුල්ගේ ධර්මදූත චාරිකාවල පසුබිම ය.
(4) ඔහු විසින් ම ප්‍රතික්ෂේප කළ ලක්ෂණ ය.

**10.** නියම පරිත්‍යාගශීලී දීමනාවක් ලෙස ජේසුස් වහන්සේ අගය කළේ,
(1) ජුදෙව් ජනතාව ආදායමින් $\frac{1}{10}$ ක් පිදීම ය.
(2) ජුදෙව් වැන්දඹුව තමා සතු කාසි දෙක ම පිදීම ය.
(3) සාකේවුස් තම ධනයෙන් $\frac{1}{2}$ ක් දුප්පතුන්ට දීම ය.
(4) සීමොන් නම් පරිසියා භෝජන සංග්‍රහයක් පැවැත්වීම ය.

**11.** ජේසුස් වහන්සේ කිතුනුවනට ලබා දෙන විමුක්තිය වන්නේ,
(1) වහල් බවෙන් විමුක්තියයි. (2) ලෞකිකත්වයෙන් විමුක්තියයි.
(3) පූර්ණ විමුක්තියයි. (4) ආත්මික විමුක්තියයි.

**12.** "සැබැවින් ම මේ මනුෂ්‍යයා නිදොස් කෙනෙකි." ජේසුස් වහන්සේගේ මරණ මොහොතේ මෙසේ පැවසුවේ කවුද?
(1) පසුතැවිලි වූ වරදකරුවා ය. (2) රෝම ශතාධිපතියා ය.
(3) අරමාතියේ ජෝසැප් ය. (4) කිරේනියේ සීමොන් ය.

**13.** දුක්විඳි පුද්ගලයන් හා සම්බන්ධ පහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගන්න.

| | දුක්විඳි පුද්ගලයා හෝ සමූහය | දුක්විඳි අවස්ථාව |
|---|---|---|
| A | දිවැසිවරු | දේව පණිවුඩය ප්‍රකාශ කළ අවස්ථාව |
| B | ඊශ්‍රායෙල් ජනයා | විදේශිකයන් හා කෲර පාලකයන් යටතේ |
| C | ගෝලයන් හා මුල් සභාව | ක්‍රිස්තු අනුගාමිකයන් ලෙස රෝම අධිරාජ්‍යයාගෙන් පීඩා විඳීම |
| D | ඉතිරි වූ සුළු පිරිස | දෙවියන් වහන්සේට පක්ෂපාතී සුළු පිරිසක් |
| E | ජේසුස් වහන්සේ | සත්‍ය උදෙසා පෙනී සිට කොන් වූවන් සමග සිටීම |

මේ අතුරින් මිසර හා බැබිලෝනියානු කෲර පාලකයන්ගෙන් පහර කෑ අය,
(1) A, B හා D ය. (2) A, B හා C ය. (3) A, B හා E ය. (4) B, C හා D ය.

**14.** යුගාන්තය පිළිබඳ ප්‍රකාශ මගින් ජේසුස් වහන්සේ අපට අනාවරණය කළේ, යුගාන්තයේ දී
(1) විවිධ ආපදාවලට මුහුණ පෑමට සිදුවන බව ය.
(2) සියල්ල හොඳින් අධ්‍යයනය කළ යුතු බව ය.
(3) ලෞකික සියලු දේ පසෙක තබා සූදානම් විය යුතු බව ය.
(4) ජයාන්විත භාවය සඳහා නිතර සූදානම්ව සිටිය යුතු බව ය.

**15.** "මනුෂ්‍ය පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නට ද ගලවා ගන්ට ද වැඩම කළ සේක." ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ,
(1) සාකේවුස්ගේ නිවසේ දී ය. (2) සීමෝන් නම් පරිසියාගේ නිවසේ දී ය.
(3) ලෙවීගේ නිවසේ දී ය. (4) මාර්තා සහ මරියාගේ නිවසේ දී ය.

**16.** "මාගේ අසල් වැසියා කවරෙක් ද" කියා ජේසුස් වහන්සේගෙන් විනයධරයන් ඇසූ අවස්ථාවේ එයට පිළිතුරු ලෙස දැක්වූ උපමා කථාව වන්නේ,
(1) ධනපතියා සහ ලාසරස් පිළිබඳ උපමා කථාව ය. (2) නැති වූ පුත්‍රයා පිළිබඳ උපමා කථාව ය.
(3) කමා නොවූ දාසයා පිළිබඳ උපමා කථාව ය. (4) යහපත් සමාරිතයා පිළිබඳ උපමා කථාව ය.

/ තුන්වැනි පිටුව බලන්න

agaram.lk
Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !

www.agaram.lk



17. ජේසුස් වහන්සේ මිටියාවතෙහි දේශනය මගින් සැබෑ සැපත හිමිකර ගැනීමට පැවසූ භාග්‍ය අතුරින් පහත සඳහන් භාග්‍යයට නිසි වරණය වන්නේ,
"දිළිඳු වූ ඔබ භාග්‍යවන්ත ය.' මක්නිසාද .........."
(1) ඔබ තෘප්තියට පැමිණෙන්නේ ය. (2) ඔබ සිනාසෙන්නේ ය.
(3) දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබගේ ය. (4) ස්වර්ගය හිමි වන්නේ නැත.

18. ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් නිවැරදි දැක්ම කරා යොමු කළ අවස්ථාව වනුයේ උන් වහන්සේගේ
(1) රූප විපර්යාස අවස්ථාව ය. (2) බෞතිස්ම අවස්ථාව ය.
(3) පරීක්ෂාවට ලක්වූ අවස්ථාව ය. (4) ගෙත්සෙමන උයනේ යාච්ඥා කළ අවස්ථාව ය.

19. කිතුනු අප ජේසුස් වහන්සේගේ අනුශාසනා අනුව ආගන්තුක සත්කාර පිරිනැමිය යුත්තේ,
(1) අපේ ම සත්කාර බලාපොරොත්තුවෙන් සිටින අයට ය.
(2) අපට නිතර සත්කාර කරන අයට ය.
(3) ප්‍රතිසත්කාර දැක්වීමට නොහැකි නෑතිබෑරි අයට ය.
(4) පූජක පිරිසට සහ සභාවේ අයට ය.

20. මුල් ශ්‍රාවකයන් කැඳවීමේ දී පේදුරුගේ ජීවිතයෙන් ඉස්මතු වූ ගුණාංග වන්නේ,
(1) දයානුකම්පාව, බැහැපත්කම හා ඉවසීමයි. (2) පසුතැවීම, ප්‍රේමය හා ඉවසීමයි.
(3) අවංක බව, බැහැපත්කම හා ප්‍රේමයයි. (4) කීකරුකම, බැහැපත්කම හා පසුතැවීමයි.

21. සමාජයේ යහපත් පරිවර්තනයක් සිදු කිරීමට ක්‍රියා කළ යුත්තේ,
(1) ආබ්‍රහම්ගේ දරුවන් ලෙස ය. (2) දේව රාජ්‍යයේ ගුණධර්ම අනුව ය.
(3) අන්‍යයන් උදෙසා අත් තබා යාච්ඥාවෙන් ය. (4) අන්‍ය මතවාදවලට අභියෝග දීමෙන් ය.

22. "පොහොසතෙකුට දේව රාජ්‍යයට ඇතුළු වීමට වඩා ඔටුවෙකුට ඉඳිකටු මලින් රිංගා යාම පහසු ය." මෙයින් ජේසුස් වහන්සේ අවධාරණය කළේ,
(1) ධනය මත ජීවිතය රඳවා ගැනීමේ අභාග්‍යයයි. (2) ඔටුවනට සාදා තිබුණු ඉඳිකටු මල පැහැදීමයි.
(3) තමා සතු දේ විකුණා දන්දීමේ වැදගත්කමයි. (4) ධනවත් ප්‍රධානියාට දුන් අවවාදයයි.

23. පාවුල්තුමා කොරින්ති වැසියනට යැවූ ලිපියේ වඩාත් වැදගත් දීමනා ලෙස දක්වන්නේ,
(1) සකල ඥානයයි. (2) ප්‍රේමයයි.
(3) දිවැස් වැකි දෙසීමේ වරමයි. (4) සියලු අභිරහස් පිළිබඳ අවබෝධයයි.

24. ජීවිත ගමනේ දී අප මුහුණපාන සමහර අතවර වන්නේ අපයෝජන, රිය අනතුරු, මත්ද්‍රව්‍ය මත්පැන් හා විවිධ ව්‍යසන ආදියයි. මේ සම්බන්ධයෙන් කිතුනු දරුවකු ලෙස ඔබගේ වගකීම කුමක් විය යුතු ද?
(1) අතවරයට ලක්වූ දරුවකුට පමණක් නිහඬව උපකාර කිරීම ය.
(2) එවැනි අභියෝග එල්ල කරන සමාජයේ පුද්ගලයන් සෙවීමයි.
(3) අභියෝගවලට මුහුණ දෙන දරුවන්ට දෙවියන්ට කැපවූ නිවාසයක් සූදානම් කිරීමයි.
(4) සමාජ පරිවර්තනයක් සඳහා සෑමවිට ම දේවරාජ්‍යයේ අගයන් තුළ ක්‍රියා කිරීමයි.

25. පහත සඳහන් වන්නේ ක්‍රිස්තු අනුගාමිකයන් ලෙස තම ජීවිතය සමාජය සඳහා කැප කළ අය වේ.
A - දේවගැති මයිකල් රුද්‍රිගෝ B - දේවගැති ජෝන් වෙස්ලි
C - ඉව්ලින් කානි D - සාකේවුස්
මොවුන් අතුරෙන් ශ්‍රී ලංකාවේ සේවය කළ දෙදෙනා කවරහු ද?
(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) C සහ D

26. ජුදා සමාජයේ කාන්තාවන්ට අහිමි වී තිබූ තත්ත්වයෙන් ඔවුනට නව භූමිකා අත්කර දුන් අවස්ථාව/අවස්ථා වන්නේ
(1) මාර්තා සහ මරියාගේ නිවසේ මරියා දේව වචනයට සවන් දීම අගය කිරීම ය.
(2) කාන්තාවන් පිරිසක් ජේසුස් වහන්සේගේ ගෝලයන් ලෙස පිළිගැනීම ය.
(3) සබත් දිනයේ කුදු ස්ත්‍රිය සුව කරමින් ආබ්‍රහම්ගේ දියණියක් ලෙස ඉදිරිපත් කිරීම ය.
(4) ඉහත අවස්ථා සියල්ල ම ය.

27. මනස්ථාපනයේ ඵල දැක්වීමට ජේසුස් වහන්සේ ජනතාවට අභියෝග කිරීමට ගෙන හැර පෑ උපමාව වන්නේ,
(1) මහා මංගල භෝජනයයි. (2) ඵලදාව නැති අත්තික්කා ගසයි.
(3) ඉඟ පටි බැඳ පහන් දල්වා තබා ගැනීමයි. (4) විශ්වාසී හා අවිශ්වාසී දාසයන් ය.

28. ජේසුස් වහන්සේ දේව රාජ්‍යයට සුදුසු වන ලෙස නායක භූමිකාවට නව අරුතක් දුන්නේ,
(1) සේවක නායක භූමිකාව පිළිගැන්වීමෙනි. (2) හැකියා උපරිම ලෙස සේවයට යෙදීමෙනි.
(3) ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කිරීමෙනි. (4) ඇති අයට වැඩියෙන් දෙනු ලැබේ යනුවෙනි.

29. එම්මාවුස් ගමට යමින් සිටි ගෝලයන් දෙදෙනා පෙරළා ප්‍රීතියෙන් ජෙරුසෙලමට ගියේ,
(1) ඔවුන්ගේ හදවත් ඇවී ඇවිළී ගිය බව කීමට ය.
(2) ජීවමාන තැනැන් වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද කීමට ය.
(3) සොහොන හිස්ව දුටු බව පැවසීමට ය.
(4) ඒකාන්තයෙන් ම උන් වහන්සේ නැගිට සිටින සේක කීමට ය.

/ හතරවැනි පිටුව බලන්න

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**30.** එදා ජේසුස් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යාමට හදිසියේ ම කිරේනියේ සීමොන්ට පැවරූ කාර්යය මඟින් අද අපට දෙන පණිවුඩය වන්නේ,
(1) අප ද කුරුසිය උසුලාගෙන යා යුතු බවයි.
(2) නොසිතන මොහොතක කෙනෙකුට උදව් වීමට ඉදිරිපත් විය යුතු බවයි.
(3) පාස්කු මංගල්‍යයට සහභාගි වී උදව් වීමේ වැදගත්කමයි.
(4) නාඳුනන අයට උදව් වීමේ දී පරෙස්සම් විය යුතු බවයි.

**31.** දුක් උසුලන සේවකයාණෝ ගැන දිවැස්වැකි එළි කරන ලද දිවැසිවරයා නම්,
(1) ආමොස් ය. (2) යෙසායා ය. (3) එලියා ය. (4) එසකියෙල් ය.

**32.** 'ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයන් ධෛර්යමත් කරන්න' මෙසේ පේදුරුට පැවසූ වදන් මඟින් අප ලබන පණිවුඩය
(1) ජේසුස් වහන්සේ අපට ඉවසීමෙන් සමාව දානය කරන බව ය.
(2) පේදුරුගේ සොහොයුරන්ට මෙන් අප ද සොහොයුරන්ට සමාව දිය යුතු බව ය.
(3) පසුතැවිල්ලට කැඳවන සැනසිලිදායක වචන බව ය.
(4) කිතුනුවන් වරදට යටත් වූ කල සහෝදරයන් ධෛර්යමත් කරන බව ය.

**33.** පහත සඳහන් වාක්‍ය අතුරෙන් කිතුනු පවුලක් තුළ **නොතිබියයුතු** ලක්ෂණයක් වන්නේ
(1) පවුලේ නිර්මාතෘවරයා දෙවියන් වහන්සේ ලෙස සැලකීම ය.
(2) පවුලේ සියලු දෙනා දෙවියන් වහන්සේ සහ එකිනෙකා සමග සබඳතා ගොඩනැගීම ය.
(3) පවුලේ සියලු දෙනා එක හා සමාන තත්ත්වයකින් පිළිගැනීම ය.
(4) පවුලේ පිරිමි දරුවන්ට හා පියාට පමණක් විශේෂ ගෞරවය දීම ය.

**34.** විවිධ හේතූන් නිසා සමාජයේ දරිද්‍රතාව පැතිර පවතී. එම තත්ත්වය පිටු දැකීමට ප්‍රතිචාරය විය යුත්තේ සමස්ත සමාජය,
(1) ආර්ථික ලෙස දියුණු කිරීම ය.
(2) දෙවියන් වහන්සේගේ දරුවන් සේ සලකා සුළු උදව් දීම ය.
(3) සියල්ලන් සමග සහයෝගයෙන් ජීවත් වීම ය.
(4) දේවරාජ්‍යයේ ගුණධර්ම වන යුක්තිය ප්‍රේමය, සාමය, යනාදියෙන් ධනවත් කිරීම ය.

**35.** මහත්මා ගාන්ධි, මාටින් ලූතර් කිං (කනිෂ්ඨ), ඩියෙට්‍රිච් බොන් හොෆර් ඉතිහාසගත වී ඇත්තේ අසාධාරණය ඉදිරියේ ඔවුන්,
(1) එයට විරුද්ධව කණ්ඩායම් ඇරඹූ නිසා ය. (2) ජීවිත පවා පරදුවට තබා හඬක් නැගූ නිසා ය.
(3) ඇරඹූ ව්‍යාපාර අසාර්ථක වූ නිසා ය. (4) එකට නැඟී සිට එකට මිය ගිය නිසා ය.

**36.** බැටළුවන් පෝෂණය කිරීම මුළු ජීවිතය පුරා හඹා යන්නා වූ කාර්යයක් බව පෙන්නුම් කළ කිතුනුවන් වන්නේ,
(1) උත්තම පූජකයන්, ලෙව්වරුන්, විනයධරයන් හා ගෝලයන් ය.
(2) අරමාතියේ ජෝසැප්, කිරේනියේ සීමොන්, මග්දලාවේ මරියා හා ගෝලයන් ය.
(3) ගුරු ලක්ෂ්මන් වික්‍රමසිංහ, ඩෙස්මන් ටූටූ, නෙල්සන් මැන්ඩෙලා හා එලිසබෙත් බේකර් ය.
(4) පාවුල්, පේදුරු, ස්නාවක ජොහන් හා කුරුසිය අසල සිටි ශතාධිපතියා ය.

**37.** ක්‍රිස්තුන් වහන්සේ සමග පෞද්ගලික සම්බන්ධතාවක් ඇති අප යුක්තිගරුක සමාජයක් ගොඩනැගීම සඳහා
(1) අන් අයට පෙනෙන සේ ආදර්ශමත් ජීවිත ගත කළ යුතු ය.
(2) පෞද්ගලික රහසිගත ජීවිතයකට පිවිසිය යුතු ය.
(3) සමාජයේ විශේෂ වරප්‍රසාද ලබා ගැනීමට යොමු විය යුතු ය.
(4) සමාජ ආකල්ප යහපත් අන්දමට වෙනස් කිරීමට ක්‍රියා කළ යුතු ය.

**38.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කිතුනු බලාපොරොත්තුවට **නොගැළපෙන** ප්‍රකාශය කුමක් ද?
(1) සමාජය තුළ සෞභාග්‍යමත් ජීවිතයක් ගත කිරීම (2) සදාකාලික ජීවනයක බලාපොරොත්තුව
(3) පාප විමුක්තියෙන් දේව වරප්‍රසාදය ලැබීම (4) අන් අය උදෙසා කැපවූ ජීවිතයක් ගත කිරීම

**39.** පහත සඳහන් වන්නේ පාවුල්ගේ ජීවිත හැරීමේ සිද්ධාන්තයි.

| | හැරීමට පෙර | හැරීමෙන් පසු |
|---|---|---|
| A | පීඩකයෙක් වීම | පීඩා විඳින්නෙක් වීම |
| B | තමා පිළිබඳ තමා ම තීරණ ගැනීම | දේව මගපෙන්වීම යටතේ තීරණ ගැනීම |
| C | තම සුරක්ෂිතභාවය ගැන සැලකිලිමත් වීම | අන් අය වෙනුවෙන් වැය වීම |
| D | වෛරය, පළිගැනීම හා මර්දනය කිරීම සඳහා තම ජීවිතයේ ප්‍රමුඛතාවක් දීම | තමාට වැරදි කරන අයට පවා කමා වීමේ හැකියාව |

ඉහත දැක්වෙන සිද්ධාන්ත තුළින් ජීවිත කැප කිරීම පෙන්නුම් කරන්නේ කුමන යුගලයෙන් ද?
(1) A, B (2) A, C (3) B, C (4) C, D

**40.** බහුවිධ සමාජයක සාමය රඳා පවතින්නේ,
(1) යුද්ධයක් නොමැති විට ය. (2) යුක්තිය හා සාධාරණත්වය ක්‍රියාත්මක වන විට ය.
(3) අන්‍යයන් කෙරෙහි අනුකම්පාව දක්වන විට ය. (4) සාම ව්‍යාපාර ගෙන යන විට ය.

**

[ පස්වැනි පිටුව බලන්න

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

15 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ක්‍රිස්තියානි ධර්මය I, II
கிறிஸ்தவம் I, II
Christianity I, II

## ක්‍රිස්තියානි ධර්මය II

※ **පළමුවන** ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
※ **පළමුවන** ප්‍රශ්නයට ලකුණු **20**ක් ද, තෝරාගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) විශේෂ දරු උපත් පිළිබඳව ගාබ්‍රියෙල් දේවදූතයා පණිවුඩ ප්‍රකාශ කළේ කවුරුන් වෙත ද?

(ii) ජේසුස් වහන්සේ පරීක්ෂාවලට මුහුණ දුන් අවස්ථාවේ දී උන් වහන්සේ දේව කැමැත්තට කීකරු වූ බව සනාථ කරන සාධක **දෙකක්** ඉදිරිපත් කරන්න.

(iii) ජේසුස් වහන්සේ දරුවන් පිළිගනිමින් ඔවුන් අගය කළ අවස්ථා කවරේ ද?

(iv) විනයධරයන් වෙත ජේසුස් වහන්සේ එල්ල කළ චෝදනා **දෙකක්** ලියා දක්වන්න.

(v) දේව රාජ්‍යයේ ප්‍රධාන ප්‍රතිපත්ති දැක්වීමට ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ උපමා **දෙකක්** සඳහන් කරන්න.

(vi) (අ) 'මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා!' මෙසේ කියා ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථාව කුමක් ද?

(ආ) එයින් කිතුනු අපට ලැබෙන පණිවුඩය කුමක් ද?

(vii) පහත සඳහන් පාඨය නිවැරදිව සම්පූර්ණ කරන්න.
"සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය. ....."

(viii) (අ) අන්තියෝකයේ සභාව ධර්මදූත සේවය සඳහා මුලින් ම තෝරාගනු ලැබුවේ කවුරුන් ද?

(ආ) එසේ කිරීමට පෙර ඔවුන් ගත් පියවර කුමක් ද?

(ix) (අ) පැරණි ගිවිසුමේ දුක් දරන්නන් ලෙස ඉදිරිපත් කර ඇත්තේ කවරහු ද?

(ආ) නව ගිවිසුමේ දුක් උසුලන සේවකයාණෝ ලෙස ඉදිරිපත් කෙරෙන්නේ කවුරුන් ද?

(x) දෙවියන් වහන්සේ විසින් ජුදෙව් සමාජයේ අනාථයන් කෙරෙහි ජුදෙව්වනට පැවරූ වගකීම් **දෙකක්** ලියන්න.

**2.** (i) ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් කැඳවූ අවස්ථා **දෙකක්** ලුහුඬින් දක්වන්න.

(ii) ගෝලයන් කැඳවූ අවස්ථාවල දී ඔවුන් දැක්වූ ප්‍රතිචාර **තුනක්** ඉදිරිපත් කරන්න.

(iii) "බිය නොවන්න, මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇත." මෙම කියමන අනුගමනය කරන වත්මන් කිතුනුවෙකු ලෙස ජේසුස් වහන්සේ සිය ශ්‍රාවක පිරිසට පැවරූ වගකීම් ඔබ ක්‍රියාවට නැගීමට බලාපොරොත්තු වන්නේ කෙසේ ද?

**3.** (i) (අ) ජේසුස් වහන්සේ සිය සේවය පිළිබඳව අනාවරණය කළේ කුමන අවස්ථාවේ දී ද?

(ආ) එහි දී භාවිත කළ පැරණි ගිවිසුම් ශුද්ධ ලියවිල්ල කුමක් ද?

(ii) එම දේශනයට සවන් දුන් ජනතාවගේ ප්‍රතිචාර ලියා දක්වන්න.

(iii) නූතන සමාජයේ විවිධ අවශ්‍යතා ඇති අය කවරහු දැයි ලැයිස්තුගත කර, එබඳු අයට උපකාර කළ හැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

[ හයවැනි පිටුව බලන්න

agaram.lk

Agaram.lk - Keep your dreams alive !

Agaram.lk - Keep your dreams alive !

www.agaram.lk



4. (i) දේවරාජ්‍යයේ පුරවැසියන් වන කිතුනු අපගෙන් බලාපොරොත්තු වන විශේෂ භූමිකා **දෙකක්** ඉදිරිපත් කරන්න.

(ii) එයින් එක් භූමිකාවක් තෝරාගෙන, එම භූමිකාව පැහැදිලි කිරීම සඳහා ජේසුස් වහන්සේ ගෙනහැර පෑ උපමා කථාව ලුහුඬින් දක්වන්න.

(iii) ඔබ ඉදිරි අනාගතයේ සමාජයට පිවිසුණු විට දේව රාජ්‍යයේ භූමිකා ක්‍රියාත්මක කරන්නේ කෙසේ දැයි කෙටියෙන් විස්තර කරන්න.

5. "පාවුල්තුමා අභියෝග මැද මෙහෙවරක යෙදුණි."

(i) පාවුල් සමග දෙවන ධර්මදූත මෙහෙවර සඳහා සහභාගි වූ අය නම් කරන්න.

(ii) එම චාරිකාවේ දී ඔවුන් ගිය ස්ථාන **තුනක්** නම් කරමින් එම ස්ථානවල දී මුහුණ දුන් අභියෝගය බැගින් ලියා දක්වන්න.

(iii) පාවුල්තුමා එදා අභියෝග ජයගත් අන්දම කිතුනු අපට සේවයේ දී අදාළ කරගත හැකි වන්නේ කෙසේ දැයි පහදන්න.

6. "උදාර මනුෂ්‍යත්වයක් සමග සාමයෙන් යුතු සහජීවනය වැදගත් වේ."

(i) හෙබ්‍රෙව් සහ ග්‍රීක යන භාෂාවලින් පූර්ණ සාමය සඳහා භාවිත වූ වචන **දෙක** ලියන්න.

(ii) ජේසුස් වහන්සේ සමාජයේ සමානාත්මතාව හා සහජීවනය ගෙන ඒමට ක්‍රියා කළ අන්දම පිළිබඳ උදාහරණ අවස්ථා **තුනක්** ඉදිරිපත් කරන්න.

(iii) පහත සඳහන් තත්ත්ව අනුව සාමය ඇති කර සහජීවනය ගොඩනැඟීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

(අ) ස්ත්‍රී පුරුෂ භේදය

(ආ) උගත් නූගත් භේදය

(ඉ) ධනවත් දුගී පරතරය

(ඊ) ස්වාමි සේවක පරතරය

(උ) භාෂා භේදය

7. (i) ඊශ්‍රායෙල් ජනතාව ඊජිප්තුවේ පාරාවෝ රජු යටතේ ලක්වූයේ කුමන පීඩාවලට ද?

(ii) ජේසුස් වහන්සේ සිය මෙහෙවර තුළ පීඩිතයන් මුදාලීමට ගත් පියවර **තුනක්** ලියන්න.

(iii) නූතන සමාජයේ ජනතාව මුහුණපාන හිංසන හා පීඩා කවරේ දැයි දක්වමින් කිතුනුවන් ලෙස ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග **පහක්** යෝජනා කරන්න.

* * *

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk